## මහ සමන් දේවාල පෙරහැර



සබරගමු පළාතේ පූජනීය ස්ථානයක් වන රත්නපුර මහ සමන් දේවාලයේ වාර්ෂිකව පවත්වනු ලබන ප්‍රධානතම උත්සවය ඇසළ පෙරහැරයි.





**සමන් දේවාල පෙරහැර හා බැඳි චාරිත්‍ර**

| දිනපතා පවත්වන චාරිත්‍ර | සතිපතා පවත්වන චාරිත්‍ර | වාර්ෂික පූජා |
|---|---|---|
| • අලුයම් ධූරයේ තේවාව<br>• හිල්ම දේවාව<br>• මහ තේවාව (දහවල්)<br>• බොලපැන් තේවාව<br>• හැන්දෑුරයේ තේවාව<br>• මහ තේවාව (රාත්‍රී කාලය) | • බදාදා හා සෙනසුරාදා පවත්වන පූජා | • අලුත් සහල් මංගල්‍යය<br>• අලුත් අවුරුදු උත්සවය<br>• ඉල්මහ කාර්තික උත්සවය<br>• ඇසළ පෙරහැර උත්සවය |

**ඇසළ පෙරහැර තුනක් දින 15 ක් පුරා පවත්වයි**

කුඹල් පෙරහැර    දේවොල් පෙරහැර    රන්දෝලි පෙරහැර

**චාරිත්‍ර විධි**

- නැකැත් සකස් කිරීම    කප් සිටුවීම
- නානු මුර මංගල්‍යය    දිය කැපීම
- ගරා යකුම නැටීම
- දිග්ගෙයි නැටුම- මාණික්‍ය මහගේ නමින්ද හැඳින්වූ කන්‍යාවන් විසින් ගායනාවලට අනුව

**පෙරහැර පිළිවෙල**

අණඬෙන වෙඩිල්ල පත්තු කිරීමෙන් පසු

- කසකරුවෝ
- ගිනිබෝලකරුවෝ
- මහබබා කෝලම- මෙය පෙරහැරේ සුවිශේෂී අංගයකි. මෙය සියලු දෝස දුරුවන බව විශ්වාසයයි.
- පෙරමුණේරාළ
- හේවිසි වාදකයෝ
- නර්තන ශිල්පීහු
- අලි ඇතුන් සහිත දළදා කරඬුව රැගත් හස්ති රාජයා
- පත්තිනි පෙරහැරේ කාන්තාවෝ
- ආභරණ වඩම්මන දෝලාව හා කුමාර රථය
- නිල ඇඳුමින් සැරසුණු නිළධාරීන්










දිය කපන අවස්ථාව

**නර්තන ,ගායන, වාදන අවස්ථා**

සබරගමු නර්තන
වෙස් නර්තන
පන්තේරු නැටුම
තෙල්මේ නැටුම
දෙවොල් නැටුම
වඩිගපටුන
උඩැක්කි නැටුම
විවිධ ජන නැටුම්

**වාදන - හේවිසි**

**කාර්ය පත්‍රිකාව**

1. සබරගමු සමන් දේවාල පෙරහැරේ මූලික චාරිත්‍ර විධි තුනක් ලියන්න.
2. මෙම පෙරහැර, පෙරහැර තුනකින් සමන්විත වන අතර එම පෙරහැර තුන නම් කරන්න.
3. සමන් දේවාල පෙරහැරේ දැකිය හැකි සුවිශේෂී අංගය ලියන්න. ඉන් අපේක්ෂා කරනුයේ කුමක්ද?
4. පෙරහැර අනුපිළිවෙළ දක්වන්න.
5. මෙම පෙරහැරේ දැකිය හැකි නර්තන පහක් ලියන්න.